# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිඩකරණලදී.

නො. 8,556—1939න්වූ දෙසැම්බර් මස 8 වෙනි දිනවූ සිකුරාද.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාඩය නීති.

#### ගම්සභා ආඥාපණත.

ගම්සභා ආඥාපණතේ (198වෙනි පරිච්ඡෙදය) 124වෙනි වගන්තියෙන් ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ කෙරෙහි පැවරී තිබෙන බලයපිට ආණ්ඩුව කරවන නිලධාරී උතුමාණන්වහන්සේ විසින් පනවනලද ව්‍යවස්ථාවකි.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

වර්ෂ 1939ගේ නොවැම්බර් මස 30වෙනි දින කොළඹදීය.

ජේ. සී. හොවාර්ඩ්,
නීතිලේකම් වම්ශ.

#### ව්‍යවස්ථාව.

වර්ෂ 1938වේ නොවැම්බර් මස 18වෙනි දින හා අඩක 8,413 දරන ගැසට් පත්‍රයෙහි පළකරනලද ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශොධිතව තිබෙන පරිදිවූ වර්ෂ 1927න් පෙබරවාරි මස 18වෙනි දින හා අඩක 7,568 දරන ගැසට් පත්‍රයෙහි පළකරන ලද ගම්තඩු සභාවල හා ගම්කාරයසභාවල අපරාධ (ක්‍රිමිනල්) නඩුවලදී කටයුතු පිළිවෙළ මෙයින් තවදුරටත් මෙහි පහත පෙනෙන ප්‍රකාර සංශොධනයකරනු ලැබේ, ඒ කෙසේදයත් :—

(1) 40වෙනි ව්‍යවස්ථාව ලගම ඉහළින් තිබෙන ශීර්ෂයේ "ලෙඛනය හා දඩපොත" යන වචන වෙනුවට "ලෙඛන" යන වචනය යෙදීමෙන්ද ;

(2) 40වෙනි ව්‍යවස්ථාවේ "දඩපොතක්ද" යන වචන වෙනුවට "දඩලේඛනයක්ද" යන වචන යෙදීමෙන්ද ;

(3) 41වෙනි ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් ව්‍යවස්ථාව යෙදීමෙන්ද ; එනම් :—

"41. එක් එක් මාසය පිළිබඳවූ දඩලෙඛනය එහි දෙවෙනි පිටපතකුත් සමග සභාපතිතැන හෝ ප්‍රධානතැන විසින් ආණ්ඩුවේ ඒජන්තතුමාවෙත ඒ මාසය ලගට පැමිණෙන මාසයේ දහවෙනි දිනට ප්‍රථමයෙන් යැවිය යුත්තේය" යනුයි.

(4) 41වෙනි ව්‍යවස්ථාව ලගම පහළින් මෙහි පහත සඳහන් 41A දරන අලුත් ව්‍යවස්ථාව යෙදීමෙන්ද ; එනම් :—

"41A. සභාපතිතැන හෝ ප්‍රධානතැන විසින් අයකරගනු ලබන දඩමුදල් තමාවෙත එවීම සම්බන්ධයෙන් සුදුසුයයි තමාට වැටහෙන අන්දමින් ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් සභාපතිතැනට හෝ ප්‍රධානතැනට නියමකර යැවීමට එතුමාට බලය ඇත්තේය. ගම්තඩු සභාවක හෝ ගම්කාරයසභාවක සැසිය පවත්වන ස්ථානයම් දිනකදීවූවත් අයකරගනු ලබන සියලුම දඩමුදල්, ඒ ඒ කාරණයට යෙදෙන හැටියෙන්, සභාපතිතැන හෝ ප්‍රධානතැන විසින් ඒ ඒ ස්ථානයේදී පවත්වන සැසිය අන්තිමේදීද, සැසිය සුමානයකට වැඩිකාලයක් පවතීනම්, එකිනෙක සුමානය අන්තිමේදීද, ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් ඒව වෙනස්වූ නියෝග ලැබී නැතිවිට එතුමාවෙත යැවිය යුත්තේය" යනුයි.

(5) අඩක I දරන උප ලෙඛනයෙහි "K" අක්ෂරය දරන ෆෝරමය වෙනුවට පහත පෙනෙන ෆෝරමය යෙදීමෙන්ද ; යන මේ ක්‍රමයෙනි.

"K" අක්ෂරය දරන ආකෘති පත්‍රය.

19 මාසයේදී විසින්

නියම්කරන ලද්දාවූද අයකරගන්නා ලද්දාවූද දඩ පිළිබඳ විස්තර ලේඛනයයි.

(හිඟහිට තිබෙන දඩමුදල් නියමිතයෙහි ඉදිරියට රතු තීන්තෙන් ලියා පෙන්විය යුතුයි.)

| 1 | 2 | 3 | 4 | 5 | | 6 | 7 | 8 | 9 | 10 | 11 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දඩය නියමකළ දිනය | නඩුවේ අංකය | පාර්ශ්වකාරයාගේ නම | අපරාධය හෝ වරද | වරදකාරයා කරනු ලැබූවේ කවර ආඥා පණතක් යටතේද | | නියම කළ දඩ මුදල | අයකොට ආදායමට ගණන් දුන් මුදල | දැනුම්දුන් අයට හෝ ලෝකල් බෝඩ් සභාව, සැනිටරි බෝඩ් සභාව යන ආදියට ගෙවනලද මුදල | 8වෙනි කොටුවේ සඳහන් ගෙවීම සඳහා ඇති බලය | කියහැකිවෙනත් කරුණු සඳහා තිබෙන කොටුවේ සඳහන් කරුණු නිසා අයකර නොගත් මුදල | කිය හැකි වෙනත් කරුණු |
| | | | | | | | | | | | |

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

No. 13,296, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුවේ සන්තක ඉඩම් ආ ණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1940ක්වූ ජනවාරි මස 22වෙනි දිනවූ සඳුදා පෙරවරු 9.30ට කුරුවිට කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් කිත්තුකරන්ට යෝජනාවී ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටිකෝරළේ උතුරු උඩපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 22ක්.

ලංකාමැනීමේ මූල් සිතියමේ නො. 392. ගම—ගංගබොඩ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | අක්. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 119 | කිරිවානකැටියේහේන .. | ගංගබොඩ පදිංචි බමුණුසිංහආරච්චිල්ලාගේ ගුණරත්මැණිකා | හේන .. | 2 | 0 | 26 |
| 167 | කම්මලගාවදෙනියේ අට්ටවත්ත | ගංගබොඩවිදානෙලාගේ බොහොපිටිහාමි .. | අට්ටවගාව | 0 | 3 | 1 |
| 211 | ඉන්දෙලේ ඇලබෝදර අට්ටවත්ත | ගංගබොඩවිදානෙලාගේ මුදියන්සේ .. .. | වත්ත .. | 1 | 0 | 17 |
| 215 | කැකුණගාවහේන, හරක් අත්තගොඩගාවහේන | ගංගබොඩ පදිංචි පතිරන්නැහෙලාගේ අප්පුහාමි විසින් හිඟ මුදල් ගෙවානැත | හේන .. | 1 | 1 | 16 |
| 226 | කිරිවානකැටියේහේන .. | ගංගබොඩ පදිංචි බමුණුසිංහආරච්චිගේ ගුණරත්මැණිකා .. | එම .. | 0 | 2 | 3 |
| 259 | උඩහමත්තෙහේන .. | එරත්නෙ පදිංචි හපුආරච්චිලාගේ මුදලිහාමි හිටපු ආරච්චි .. | එම .. | 0 | 2 | 0 |
| 264 | උඩහහේන, උඩහවත්තෙහේන | ගංගබොඩවිදානෙලාගේ නොහොත් බලන්ගොඩ මුහන්දිරම ලාගේ මුදියන්සේ විසින් වැඩිපුර අල්ලාගෙන තිබෙන බිම | වත්ත .. | 0 | 1 | 0 |
| 269 | ඉඹුලෙතැන්නෙහේන .. | අඩම්කන්දෙ පදිංචි හපුආරච්චිවිදානෙලාගේ අප්පුහාමි විසින් හිඟ මුදල් ගෙවානැත | හේන .. | 1 | 0 | 6 |
| 300 | මහදෙනියේහේන .. | ගංගබොඩ පදිංචි පතිරන්නැහෙලාගේ අප්පුහාමි විසින් හිඟ මුදල් ගෙවානැත | එම .. | 3 | 1 | 14 |
| 307 | ඉදුරුගලහේන, ඉඹිල්ල මන්කිටියේහේන | මාතුවාගල පදිංචි අයිතිවාසිකම් කියන ලාබාලිකාවූ පතිරන්නැහෙලාගේ පුංචිමහත්මයාගේ රත්මැණිකා වෙනුවට නීති ප්‍රකාර පත්කරනලද භාරකාරවූ මාතුවාගල පදිංචි පතිරන්නැහෙලාගේ අප්පුහාමි | එම .. | 5 | 0 | 15 |
| 312 | ඉදුරුගලපල්ලේහේන්යාය | හැරහාමිගේ ඩිංගිරිමැණිකේ .. .. | එම .. | 1 | 0 | 7 |
| 313 | එම .. | පරකලකන්දෙ පදිංචි බාලහාමිලාගේ අප්පුහාමිගේ රත්රන්හාමි | එම .. | 1 | 0 | 9 |
| 324 | මීගහහිනහේන .. | හල්ලද්දලාගේ ඩිංගිරි අප්පු වෙනුවෙන් එරත්නෙ පදිංචි මුර මුදලිගේ චාර්ල්ස්අප්පු | එම .. | 2 | 0 | 8 |
| 352 | කිලින්ගහතැන්නෙ හේනෙ වත්ත | (1) පතිරන්නැහෙලාගේ අප්පුහාමි, (2) ගංගබොඩවිදානෙලාගේ නොහොත් බලන්ගොඩ මුහන්දිරමලාගේ මුදියන්සේ, (3) එම බොහොපිටිහාමි, (4) එම අප්පුහාමි, (5) මුදලිහාමි, (6) ඩිංගිරිමහත්මයා, (7) එච්. ඒ. ඩී. උක්කුබන්ඩා, (8) කලහආරච්චිල්ලාගේ ඩිංගිරිමහත්මයා | වත්ත .. | 2 | 1 | 10 |
| 370 | කොරම්ල්ලෙගාවහේන .. | කොස්ගහඉන්නලාගේ හාමිදුරියා .. .. | හේන .. | 0 | 2 | 33 |
| 370½ | එම .. | හෑකත්කියන්නාලාගේ අවුහේරිසා, (2) එම දමිතා .. | වත්ත .. | 0 | 3 | 0 |
| 370⅓ | වැද්දදෙලගාවහේන, කොරම්ල්ලෙගාවහේන | එම .. .. .. | එම .. | 0 | 2 | 11 |
| 370$_7$ | දෙබන්ගහලෙනගාවහේන, කොරම්ල්ලෙගාවහේන | කොස්ගහඉන්නලාගේ ජනිසා .. .. | රබර් .. | 2 | 0 | 14 |
| 370$\frac{1}{10}$ | දෙබන්ගහලෙනගාවහේන, දෙබන්ගහලෙනගාව පාවුලේහේන | එම .. .. .. | හේන .. | 3 | 3 | 36 |
| 379 | කිරිදිංවලගාවදෙනිය .. | ගංගබොඩවිදානෙලාගේ නොහොත් බලන්ගොඩ මුහන්දිරමලාගේ බස්තුහාමි | කුඹුර .. | 0 | 2 | 3 |
| 392 | කබරගලපල්ලේහේන .. | රයිගම්කෝරළේ කන්දනපිටියෙ පදිංචි රයිගමගේ රොබෝ සිංඤෝ | හේන .. | 3 | 0 | 6 |
| 413 | මහවත්තගාවහේන .. | ආණ්ඩුව .. .. .. | එම .. | 0 | 0 | 33 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1939ක්වූ දෙසැම්බර් මස 2වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

No. 13,297, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1940ක්වූ ජනවාරි මස 24වෙනි දිනවූ බදාදා පෙරවරු 9.30ට කුරුවිට කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට හෝ නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටිකෝරළේ උතුරු උඩපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 7ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 252. ගම—එල්ලාවල ඉහලගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 66½ | ගොඩපොරගහහේනේවත්ත | එල්ලාවල ඉහලගම පදිංචිව සිට නැසිගිය කුඹාදුරගේ උපේන්දුගේ උරුමක්කාරයෝ | වත්ත .. | 0 0 35 |
| 270T | උරුකාපෙලහේන්යාය .. | මාර්සල්ලස් ද අබෲ අබේසිංහගේ උරුමක්කාරයෝ .. | හේන සහ රබර් .. | 2 2 18 |
| 311B | ගොයන්කොලේහේන .. | (1) එල්ලාවල ඉහලගම පදිංචි ඉමියාසාමිල්ලාගේ රත්රන්සාමි, (2) මියලගොඩ පදිංචි එම රංචුහනා, (3) එම මැනික්එකනා | හේන .. | 0 2 7 |
| 314 | ගුලංගත්හේන .. | එල්ලාවල ඉහලගම පදිංචි (1) කලුඅප්පුලාගේ හරමාණිස් අප්පු සහ (2) යෝගම බබහැලගේ කිරිඅප්පු විසින් නියමුදල් ගෙවා නැත | එම .. | 0 1 11 |
| 316 | ගුලහේන්දෙනිය .. | එම .. .. .. | දෙනිය .. | 1 1 6 |
| 350O | ඉහලකුඹුරගාවහේන්යාය .. | (1) ඔද්දුමගේ කරුනාවතී හාමිනේ, (2) බමුනසිංහ ආරච්චිල්ලාගේ ප්‍රේමාවතී, (3) එම රත්නසේන, (4) එම සිරිසේන, (5) එම පියසේන, (6) එම ජිනසේන, (7) ඇහැලියාගොඩ මියලගොඩවත්තේ පදිංචි ආර්. ඇම්. රොබර්ට්ගේ කෝනාමහත්මී | හේන සහ රබර් .. | 4 1 12 |
| 425 | හොරගොල්ලහේනේදෙනිය | එල්ලාවල පහලගම පදිංචි (1) බවුංගෙදර දවිතාලාගේ පොඩිසිඤ්ඤෝ සහ (2) එම පුංචිසිඤ්ඤෝ විසින් නියමුදල් ගෙවා නැත | දෙනිය .. | 0 2 14 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1939ක්වූ දෙසැම්බර් මස 2වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

No. 13,298, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1940ක්වූ ජනවාරි මස 24වෙනි දිනවූ බදාදා පෙරවරු 10ට කුරුවිට කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට හෝ නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටිකෝරළේ දකුණු උඩපත්තු කොටසේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 400. ගම—රත්ගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 179 | වත්තපායහේන .. | රත්ගම පදිංචි එරත්නලාගේ පොඩිනා .. | හේන .. | 0 3 18 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කාරක නිලධාරීතුමාගෙන්ද, එහි සිතියම කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1939ක්වූ දෙසැම්බර් මස 2වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—සින්නකින්නියාවේ වැසිකිළියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "5වෙනි කලාපයේ 203වෙනි පරිච්ඡේදය වන ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ සභාසහිත පිට පලාත් පාලන කාරක සභාවෙන් නියිආකාර මව අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. 6 දරන අන්තිම ටෝපෝ සිතියමේ නො. 1 දරන අතිරේකයේ 5වෙනි ඉන්සෙට්එක.
ගම—සින්නකින්නියාව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1926 | කච්චේරියාත්තුවලවු.. | ගලෙන්බැඳ උළුසෙවිලිකරණලද වැසිකිළියක කොටසක් අඩංගු පාළුබිම (සිර ගොඩනැගිල්ල) | සින්නකින්නියාවේ පදිංචි අබ්දුල් රහුමාන් අබ්සුලෙබ්බේ | 0 0 2·8 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇතැයාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1940ක්වූ ජනවාරි මස 10වෙනි දින උදේ 9ට (නොරළයට) සින්නකින්නියාවේ මඩමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අයුරේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මේ ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින ත්‍රිකුණාමලේ කච්චේරියේදීය.

සී. ජේ. ඩේන් ලෑන්ක්වූ,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—හාලිඇල ආණ්ඩුවේ දොස්තර මහත්මයාට බංගලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මව අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

අන්තිම ගම්සිතියමේ නො. 1ගේ අතිරේකය නො. 1. ගම—නාවලගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 792 | පින්අරුවේවත්ත .. | අවුරුදු 30ගේ පොල්ගස් 1,520ක්ද, කොස්ගස් 3ක්ද, අවුරුදු 3ගේ කොස්ගස් 2ක්ද තිබේ | හාලිඇල සැන්ට් ජේ. පෙරේරා මහත්මයා | 0 2 2·7 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1940ක්වූ ජනවාරි මස 16වෙනි දින පෙරවරු 9ගේ කාලයට හාලිඇල ගමන් බංගලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අයුරේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මේ ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින බදුල්ල කච්චේරියේදීය.

ඇන්. ජේ. ලම්බ්ටන්,
ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වෙනුව.

## ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීම්.

### අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

(මධ්‍යම පළාතේ ලාංඡිකයන් සම්බන්ධයෙනි.)

මෙහි පහත විස්තර දැක්වෙන ඉඩම් සඳහාවූ ඉල්ලුම්පත්‍ර කල්පනාවට ගනු පිණිසත් කොටස් වශයෙන් ඒ ඉඩම්වලට අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගැනීම පිණිසත් මුරුතැන්ගේ ගම්සභා උසාවියේදී වර්ෂ 1940ක්වූ ජනවාරි මස 25වෙනි බ්‍රහස්පතින්දා දින පූ. භා. 10ට 1935 අංක 19 දරන ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් වයඹ පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. මේ ඉඩම්කච්චේරි මධ්‍යම පළාතේ ලාංඡිකයන්ට පමණකි.

3. සියලුම ඉල්ලුම්පත්‍ර වයඹ දිසාවේ ඒජන්තතුමාගෙන් ලබාගතහැකි L. C. 44 දරණ පෝරම්වල ආණ්ඩුවේ ඒජන්තතුමාවෙත කුරුණෑගල කච්චේරියට වර්ෂ 1940ක්වූ ජනවාරි මස 9වෙනි දින හෝ ඊට මත්තෙන් ලැබිය යුතුයි.

4. ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම්කර තිබෙන ප්‍රමාණයේ හැටියට අක්කරයට රු. 3 බැගින් වැටෙන මුදලක් සියලුම ඉල්ලුම්පත්‍රත් සමග එවිය යුතුයි. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා වුවමනා නැති අමතර මැනීමක්කිරීමට ආණ්ඩුවට සිදුවුවහොත් මේ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මුදලක් ඒ ඒ විශේෂ අවස්ථාවලදී ආපසු දීම හෝ නොදීම යුක්තිසහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරන තීරණය අවසාන තීරණය වන්නේය.

5. සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙණීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි. ඉල්ලුම්කරු, නියෝජිත යන දෙදෙනාගෙන් එක්කෙනකුවත් ඉඩම් කච්චේරියට නොපැමිණියොත් ඉල්ලුම්කරු තම ඉල්ලීම සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාකිරීමට අකැමති බැව් ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් සලකනු ලැබේ.

6. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

7. මෙහි පහත සඳහන් ඉඩම්වල සිතියම් හෝ එහි කොපි සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන් ඊට ගෙවියයුතු මුදල් ගෙවා ලබාගතහැක.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

දීමට යන ඉඩමේ විස්තර.

F. V. P. 1,379. ගම—කටුගම්පොළහත්පත්තුවේ කිණිගමකෝරලේ කොස්ගහගොඩ.

| කැබැල්ල. | ප්‍රමාණය (කිට්ටු වශයෙන්), අ. රූ. ප. | මේ ඉඩම්වල වැවීමට සුදුසු ශාක වගී. |
|---|---|---|
| 5 (කොටසක්) | .. 48 1 17 | .. පොල් |

### අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

(මධ්‍යම පළාතේ ලාංඡිකයන් සම්බන්ධයෙනි.)

මෙහි පහත විස්තර දැක්වෙන ඉඩම් සඳහාවූ ඉල්ලුම්පත්‍ර කල්පනාවට ගනු පිණිසත් කොටස් වශයෙන් ඒ ඉඩම්වලට අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගැනීම පිණිසත් කුරුණෑගල කච්චේරියේදී වර්ෂ 1940ක්වූ ජනවාරි මස 31වෙනි බදාදා දින පූ. භා. 10ට 1935 අංක 19 දරන ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් වයඹ පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. මේ ඉඩම් කච්චේරි මධ්‍යම පළාතේ ලාංඡිකයන්ට පමණකි.

3. සියලුම ඉල්ලුම්පත්‍ර වයඹ දිසාවේ ඒජන්තතුමාගෙන් ලබාගතහැකි L. C. 44 දරණ පෝරම්වල ආණ්ඩුවේ ඒජන්තතුමා වෙත කුරුණෑගල කච්චේරියට වර්ෂ 1940ක්වූ ජනවාරි මස 10වෙනි දින හෝ ඊට මත්තෙන් ලැබිය යුතුයි.

4. ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම්කර තිබෙන ප්‍රමාණයේ හැටියට අක්කරයට රු. 3 බැගින් වැටෙන මුදලක් සියලුම ඉල්ලුම්පත්‍රත් සමග එවිය යුතුයි. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා වුවමනා නැති අමතර මැනීමක් කිරීමට ආණ්ඩුවට සිදුවුවහොත් මේ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මුදලක් ඒ ඒ විශේෂ අවස්ථාවලදී ආපසු දීම හෝ නොදීම යුක්තිසහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරන තීරණය අවසාන තීරණය වන්නේය.

5. සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි ඉල්ලුම්කරු, නියෝජිත යන දෙදෙනාගෙන් එක්කෙනකුවත් ඉඩම් කච්චේරියට නොපැමිණියොත් ඉල්ලුම්කරු තම ඉල්ලීම සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාකිරීමට අකැමති බැව් ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් සලකනු ලැබේ.

6. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

7. මෙහි පහත සඳහන් ඉඩම්වල සිතියම් හෝ එහි කොපි සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන් ඊට ගෙවියයුතු මුදල් ගෙවා ලබාගතහැක.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

දීමට යන ඉඩම්වල විස්තර.

F. V. P. 1,575. ගම—දේවමැදිහත්පත්තුවේ බලදෙරකෝරලේ හේන්ගමුව.

| කැබැල්ල. | ප්‍රමාණය (කිට්ටු වශයෙන්), අ. රූ. ප. | | | මේ ඉඩම්වල වැවීමට සුදුසු ශාක වගී. |
|---|---|---|---|---|
| 11 | .. 0 | 2 | 2 | දේශගුණ කලාපයේ වැවෙන කටුසර හෝග නොහොත් පොල් සහ වෙනත් ස්ථිර වගා |
| 20 | .. 20 | 0 | 14 | |
| 21 (කොටස) | .. 61 | 2 | 8 | |
| 66 | .. 1 | 0 | 8 | |
| 67 | .. 25 | 1 | 28 | |
| 68 | .. 1 | 1 | 4 | |
| | 109 | 3 | 24 | |

## දැන්වීමයි.

ගම්සභා ආඥාපනත.

(198වෙනි පරිච්ඡේදය.)

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ ගම්සභා උසාවිවල වර්ෂ 1934 ජනවාරි මස 1වෙනි දින සිට වර්ෂ 1937 දෙසැම්බර් මස 31වෙනි දින දක්වා තීන්දුකරණලද ක්‍රිමිනල් නඩුපොත්, වර්ෂ 1940 ජනවාරි මස 15වෙනි දින කොළඹ කච්චේරියේදී පුළුස්සාදමන බවද, එම නඩුවලට අමුනාපලද යම්කිසි ලිප්ප්‍රතිරප්ප ආදියක් යම්කෙනෙකුට උවමනානම් එකී දිනට ප්‍රථමයෙන් මගෙන් ඉල්ලාසිටියයුතු බවත් මෙයින් දන්වමි.

ජේ. පී. කන්දසියා,
බස්නාහිර පළාතේ දිසාපතිතුමා වෙනුවට.

වර්ෂ 1939ක්වූ නොවැම්බර් මස 29වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.